# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - නර්තන හා නාට්‍ය කලා පීඨය
# නාට්‍ය, මුද්‍රානාට්‍ය හා නූතන නර්තන අධ්‍යයනාංශය

## උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමේ යෝග්‍යතා පරීක්ෂණය - 2026

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නාට්‍ය, මුද්‍රානාට්‍ය හා නූතන නර්තන අධ්‍යයනාංශයෙහි ප්‍රධාන උපාධි පාඨමාලා 03 ක් ක්‍රියාත්මක වේ. (01) රූපණය, (02) නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය, හා (03) මුද්‍රානාට්‍ය හා නූතන නර්තනය එම පාඨමාලා වේ. උසස් පෙළ නාට්‍ය හා රංග කලාව විෂයය හදාරා ඇති අපේක්ෂකයන්ට රූපණය සහ නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය යන පාඨමාලා දෙකට ම අයදුම් කළ හැකි ය. මුද්‍රානාට්‍ය හා නූතන නර්තන පාඨමාලාවට අයදුම් කළ හැක්කේ උසස් පෙළ නාට්‍ය හා රංග කලාව සහ/හෝ නර්තනය යන විෂයයන් හැදෑරූ අපේක්ෂකයන්ට පමණි. අපේක්ෂකයන්ට තමන්ට අභිමත පාඨමාලා සඳහා අයදුම් කළ හැකි අතර, ඉහත සඳහන් පාඨමාලා ත්‍රිත්වයට ම අයදුම් කර පෙනී සිටියහොත්, අපේක්ෂකයා විසින් වැඩි පරිසාධිතබවක් පෙන්නුම් කරන ලද විෂයය මාලාව සඳහා ඇය/ඔහු තෝරාගනු ලැබේ.

- **යෝග්‍යතා පරීක්ෂණයේ ස්වභාවය**

මෙම යෝග්‍යතා පරීක්ෂණය, ඉහත සඳහන් උපාධි පාඨමාලා අරමුණු කරගත් ලිඛිත පරීක්ෂණයකින් සහ ප්‍රායෝගික පරීක්ෂණයකින් සමන්විත ය. ලිඛිත පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය දින දෙකක දී පැවැත්වේ .

- **පරීක්ෂක මණ්ඩලයේ ලකුණු ගණනය කිරීම**

මෙම අභියෝගතා පරීක්ෂණයේ පරීක්ෂක මණ්ඩලය, අභ්‍යන්තර කථිකාචාර්යවරුන්, සහ බාහිර විෂයය ප්‍රවීණයන්ගෙන් සමන්විත ය. අපේක්ෂක අපේක්ෂිකාවන්ට ලකුණු ප්‍රදානය කෙරෙන්නේ අදාළ පරීක්ෂණයේ එක් එක් කොටස් සඳහා පිරිනමන ලකුණුවල එකතුවක් ලෙස ය.

**ඔබ යෝග්‍යතා පරීක්ෂණය සඳහා සූදානම් වීමේ දී සැලකිය යුතු වෙනත් කරුණු**

- ඔබගේ ඉදිරිපත් කිරීම් නිසි ලෙස පුහුණු කළ යුතු ය.
- ඔබට ලබා දී ඇති නාට්‍ය පෙළ සහ ගීත ආදිය තම මතකයෙන් ඉදිරිපත් කළ යුතු ය.
- ඔබේ රංගය සඳහා රංග වස්ත්‍ර හා අංගරචනා අපේක්ෂා නොකෙරේ. පහත පෙන්වා දී ඇති ආකාරයේ කළු හෝ තද පැහැති පුහුණු ඇඳුමක් පමණක් ප්‍රමාණවත් වේ.



- රංගයට අත්‍යාවශ්‍ය නම් පමණක් සරල රංග භාණ්ඩයක් භාවිත කළ හැකි ය.

- **පරීක්ෂණයෙන් ප්‍රතික්ෂේප වීමට හෝ ඇගයීම අත්හිටුවීමට හේතු**

  - අයදුම් කරන්නා වෙනුවට ව්‍යාජ ලෙස වෙනත් අයෙකු පෙනී සිටීම.
  - නිර්දේශිත ඇගයීම් ඛණ්ඩ සඳහා නිසි ලෙස සූදානම් වී නොමැති වීම.

ඔබේ යෝග්‍යතා පරීක්ෂණය පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීමට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසෙන්න: **https://vpa.ac.lk**

/ක් එක් පාඨමාලා සඳහා නිර්දේශිත පරීක්ෂණ පහත දැක්වේ.

- රූපණය සහ නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය පාඨමාලා සඳහා පමණක් අයදුම් කරන අපේක්ෂකයින් ඉදිරිපත් විය යුතු පරීක්ෂණ

| රූපණය හෝ නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය උපාධි පාඨමාලව සඳහා පමණක් ඉදිරිපත් වන්නන් | විස්තරය | ලබා දෙන ලකුණු |
|---|---|---|
| ලිඛිත පරීක්ෂණය | නිර්මාණාත්මක රචනය, නාට්‍ය අධ්‍යක්ෂණය, නාට්‍යමය සිද්ධි ගොඩනැගීම හා දෙබස් රචනය සහ විචාරාත්මක රචනය යන අංශ පිළිබඳ ව අපේක්ෂකයාගේ කුසලතාව සහ දැනුම මෙහි දී පරීක්ෂාවට ලක් කෙරේ.<br><br>මෙය පැය 1 මිනිත්තු 30 ක ලිඛිත පරීක්ෂණයකි. අපේක්ෂකයා කොටස් 03 ක් යටතේ පිළිතුරු සැපයිය යුතු වේ. පළමු හා දෙවන කොටස සඳහා ලකුණු 15 ක් බැගින් ද, තෙවන කොටස සඳහා ලකුණු 10 ක් ද හිමි වේ. | 40% |
| ප්‍රායෝගික පරීක්ෂණය: 01 ඒකල භාෂණය | නිර්දේශ කරනු ලබන කේවල භාෂිය / ආත්ම භාෂිය නාට්‍ය පිටපත් කොටස් හයෙන් එකක් (01) පමණක් තෝරාගෙන එය රූපණය සමඟින් ඉදිරිපත් කළ යුතු ය.<br><br>ලබාදෙන පිටපත ඒකල භාෂණයක් ලෙස ගොඩනැගීම, කටහඬ ප්‍රක්ෂෙප්ණය හා හැසිරවීම, උචිත භාවාර්ථ දැනවීම හා අංග ප්‍රත්‍යාංග භාවිතය ආදි රූපණ හැකියාව මෙහි දී ඇගයීමට අපේක්ෂා කෙරේ.<br><br>(මෙම ලේඛනය අවසානයේ නිර්දේශිත ඒකල භාෂණ අමුණා ඇත) | 20% |
| ප්‍රායෝගික පරීක්ෂණය: 02 එසැණ නිරූපණය | ප්‍රායෝගික පරීක්ෂක මණ්ඩලය විසින් ඔබ වෙත සපයනු ලබන නාටකීය අවස්ථාව තෝරා ගනිමින් එසැණ නිරූපණයක් ඉදිරිපත් කළ යුතු ය.<br><br>ක්ෂණික නිරූපණයෙහි නාට්‍ය මාධ්‍යය භාවිතය, නිර්මාණාත්මක බව, සිදුවීම් පෙළගැස්ම සහ රංගන කුසලතාව මෙහි දී ඇගයීමට ලක් කෙරේ. | 20% |
| ප්‍රායෝගික පරීක්ෂණය: 03 නාට්‍ය ගීතය | අපේක්ෂකයාට අභිමත නාට්‍ය ගීතයක් තෝරාගෙන උචිත රූපණය ද සමගින් ඉදිරිපත් කළ යුතු ය.<br><br>(ඒ සඳහා සංගීතය විශ්වවිද්‍යාලයේ සහය වාදකවරුන් විසින් සපයනු ලැබේ. නැතහොත් ඒ සඳහා අනුවාදනයක් Pendrive එකක රැගෙන ආ යුතු ය.)<br><br>මෙම ඇගයීමේ දී අපේක්ෂකයාගේ ගායන හැකියාව, ගායනය සමගින් රූපණ හැකියාව ශාරීරික රිද්මය පිළිබඳ කුසලතා ඇගයීමට ලක් කෙරේ. | 20% |
| | මුළු ලකුණු | **100%** |

- මුද්‍රානාට්‍ය හා නූතන නර්තනය පාඨමාලාව සඳහා පමණක් අයදුම් කරන අපේක්ෂකයින් ඉදිරිපත් විය යුතු පරීක්ෂණ

| මුද්‍රානාට්‍ය හා නූතන නර්තනය උපාධි පාඨමාලව සඳහා පමණක් ඉදිරිපත් වන්නන් | විස්තරය | ලබා ... ලකුණු |
| --- | --- | --- |
| ලිඛිත පරීක්ෂණය | නිර්මාණාත්මක රචනය, නාට්‍ය අධ්‍යක්ෂණය, නාට්‍යමය සිද්ධි ගොඩනැගීම හා දෙබස් රචනය සහ විචාරාත්මක රචනය යන අංශ පිළිබඳ ව අපේක්ෂකයාගේ කුසලතාව සහ දැනුම මෙහි දී පරීක්ෂාවට ලක් කෙරේ.<br><br>මෙය පැය 1 මිනිත්තු 30 ක ලිඛිත පරීක්ෂණයකි. අපේක්ෂකයා කොටස් 03 ක් යටතේ පිළිතුරු සැපයිය යුතු වේ. පළමු කොටස සඳහා ලකුණු 10 ක් ද, දෙවන කොටස සහ තෙවන කොටස සඳහා ලකුණු 15 බැගින් ද හිමි වේ. | 40% |
| ප්‍රායෝගික පරීක්ෂණය: 01 නර්තනාංගය | අපේක්ෂකයා විසින් පුහුණු වූ මුද්‍රානාට්‍ය හෝ නව නිර්මාණ නර්තන ඛණ්ඩයක් මේ සඳහා ඉදිරිපත් කළ යුතු ය.<br><br>මෙම ඉදිරිපත් කිරීමට මුද්‍රානාට්‍යයට අමතර ව බටහිර බැලේ (ballet), නිදහස් චලන නර්තන (freestyle movement dance), ජන නැටුමක්, ශාන්තිකර්ම නර්තනයක්, සංගීතානුසාරී රංගවින්‍යාසයක් (musical choreography) යනාදී ඕනෑ ම ශෛලියක ආභාසය ලබා ගත හැකි ය.<br><br>(නර්තනයට අදාළ සංගීතය හෝ වාදනය ඔබගේ අභිමතය පරිදි සපයා ගත යුතු අතර එම වාදනය Pendrive එකක රැගෙන ආ යුතු ය)<br><br>නර්තන හැකියාව, ශාරීරික හැඩතල හා චලනයන්හි උචිත බව, තාල/රිද්ම නිරූපණය, භාව නිරූපණය, විශේෂ කුසලතා, හා සමස්ත ප්‍රාසංගික බව යනාදිය මෙහි දී ඇගයීමට අපේක්ෂා කෙරේ. | 20% |
| ප්‍රායෝගික පරීක්ෂණය: 02 ඒකල භාෂණය | නිර්දේශ කරනු ලබන ඒකල භාෂිය නාට්‍ය පිටපත් කොටස් හයෙන් එකක් (01) පමණක් තෝරාගෙන එය රූපණය සමගින් ඉදිරිපත් කළ යුතු ය. ලබාදෙන පිටපත ඒකල භාෂණයක් ලෙස ගොඩනැගීම, කටහඬ ප්‍රක්ෂේපණය හා හැසිරවීම, උචිත භාවාර්ථ දැනවීම හා අංග ප්‍රත්‍යාංග භාවිතය ආදි රූපණ හැකියාව මෙහි දී ඇගයීමට අපේක්ෂා කෙරේ.<br>(මෙම ලේඛනයේ අවසානයේ නිර්දේශිත ඒකල භාෂණ අමුණා ඇත) | 20% |
| ප්‍රායෝගික පරීක්ෂණය: 03 එසැණ නර්තනය | ප්‍රායෝගික පරීක්ෂක මණ්ඩලය විසින් ඔබ වෙත සපයනු ලබන නාටකීය අවස්ථාවක් කේන්ද්‍ර කර ගනිමින් එසැණ නර්තනයක් ඉදිරිපත් කළ යුතු ය. (මේ සඳහා සංගීතය පරීක්ෂක මණ්ඩලය විසින් සපයනු ලැබේ)<br><br>එසැණ නර්තනයෙහි නිර්මාණාත්මක බව, නර්තනය ඇසුරින් සිදුවීම් ඉදිරිපත් කිරීම, සහ නර්තන කුසලතාව මෙහි දී ඇගයීමට ලක් කෙරේ. | 20% |
| මුළු ලකුණු | | **100%** |

- රූපණය, නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය සහ මුද්‍රානාට්‍ය හා නූතන නර්තනය යන පාඨමාලා ත්‍රිත්වය ම සඳහා අයදුම් කරන අපේක්ෂකයින් ඉදිරිපත් විය යුතු පරීක්ෂණ

| රූපණය, නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය සහ මුද්‍රා නාට්‍ය හා නූතන නර්තනය යන පාඨමාලා ත්‍රිත්වය ම සඳහා ඉදිරිපත් වන්නන් | විස්තරය | ලබාදෙන ලකුණු |
|---|---|---|
| ලිඛිත පරීක්ෂණය | නිර්මාණාත්මක රචනය, නාට්‍ය අධ්‍යක්ෂණය, නාට්‍යමය සිද්ධි ගොඩනැගීම හා දෙබස් රචනය සහ විචාරාත්මක රචනය යන අංශ පිළිබඳ ව අපේක්ෂකයාගේ කුසලතාව සහ දැනුම මෙහි දී පරීක්ෂාවට ලක් කෙරේ.<br><br>මෙය පැය 1 මිනිත්තු 30 ක ලිඛිත පරීක්ෂණයකි. අපේක්ෂකයා කොටස් 03 ක් යටතේ පිළිතුරු සැපයිය යුතු වේ. පළමු හා දෙවන කොටස සඳහා ලකුණු 15 ක් බැගින් ද, තෙවන කොටස සඳහා ලකුණු 10 ක් ද හිමි වේ. | 40% |
| ප්‍රායෝගික පරීක්ෂණයෘ 01.1 ඒකල භාෂණය | නිර්දේශ කරනු ලබන කේවල භාෂීය/ඒකල භාෂීය නාට්‍ය පිටපත් කොටස් හයෙන් එකක් (01) පමණක් තෝරාගෙන එය රූපණය සමගින් ඉදිරිපත් කළ යුතු ය.<br><br>ලබාදෙන පිටපත ඒකල භාෂණයක් ලෙස ගොඩනැගීම, කටහඬ ප්‍රක්ෂේපණය හා හැසිරවීම, උචිත භාවාර්ථ දනවීම හා අංග ප්‍රත්‍යාංග භාවිතය ආදි රූපණ හැකියාව මෙහි දී ඇගයීමට අපේක්ෂා කෙරේ.<br><br>(මෙම ලේඛනයේ අවසානයේ නිර්දේශිත ඒකල භාෂණ අමුණා ඇත) | 20%<br><br>(මෙම කොටස් දෙක ම අනිවාර්ය ඉදිරිපත් කිරීම් වන අතර මෙම ඉදිරිපත් කිරීම් දෙකෙන් වඩාත් පරිසාධිත මට්ටමක් නිරූපණය කරන අංගය සඳහා ලකුණු හිමි වේ.) |
| ප්‍රායෝගික පරීක්ෂණයෘ 01.2 නර්තනාංගය | අපේක්ෂකයා විසින් පුහුණු වූ මුද්‍රා නාට්‍ය හෝ නව නිර්මාණ නර්තන ඛණ්ඩයක් මේ සඳහා ඉදිරිපත් කළ යුතු ය.<br><br>මෙම ඉදිරිපත් කිරීමට මුද්‍රානාට්‍යයට අමතර ව බටහිර බැලේ (Ballet), නිදහස් චලන නර්තන (Freestyle movement dance), ජන නැටුමක්, ශාන්තිකර්ම නර්තනයක්, සංගීතානුසාරී රංගවින්‍යාසයක් (Musical choreography) යනාදී ඕනෑ ම ශෛලියක ආභාසය ලබා ගත හැකි ය.<br><br>(නර්තනයට අදාළ සංගීතය හෝ වාදනය ඔබගේ අභිමතය පරිදි සපයා ගත යුතු අතර එම වාදනය Pen drive එකක රැගෙන ආ යුතු ය.)<br><br>නර්තන හැකියාව, ශාරීරික හැඩතල හා චලනයන්හි උචිත බව, තාල/රිද්ම නිරූපණය, භාව නිරූපණය, විශේෂ කුසලතා, හා සමස්ත ප්‍රාසංගික බව යනාදිය මෙහි දී ඇගයීමට අපේක්ෂා කෙරේ. | |

| | | |
|---|---|---|
| ප්‍රායෝගික පරීක්ෂණයː 02<br><br>එසැණ නිරූපණයක් හෝ එසැණ නර්තනයක් | ප්‍රායෝගික පරීක්ෂක මණ්ඩලය විසින් ඔබ වෙත සපයනු ලබන නාටකීය අවස්ථාව කේන්ද්‍ර කර ගනිමින් එසැණ නිරූපණයක් ඉදිරිපත් කළ යුතු ය.<br><br>ක්ෂණික නිරූපණයෙහි නාට්‍ය මාධ්‍යය භාවිතය, නිර්මාණාත්මක බව, සිදුවීම් පෙළගැස්ම සහ රංගන කුසලතාව මෙහි දී ඇගයීමට ලක් කෙරේ.<br><br>හෝ<br><br>ප්‍රායෝගික පරීක්ෂක මණ්ඩලය විසින් ඔබ වෙත සපයනු ලබන නාටකීය අවස්ථාවක් කේන්ද්‍ර කර ගනිමින් එසැණ නර්තනයක් ඉදිරිපත් කළ යුතු ය.<br><br>(මේ සඳහා සංගීතය පරීක්ෂක මණ්ඩලය විසින් සපයනු ලැබේ)<br><br>එසැණ නර්තනයෙහි නිර්මාණාත්මක බව, නර්තනය ඇසුරින් සිදුවීම් ඉදිරිපත් කිරීම, සහ නර්තන කුසලතාව මෙහි දී ඇගයීමට ලක් කෙරේ. | 20% |
| ප්‍රායෝගික පරීක්ෂණයː 03 නාට්‍ය ගීතය | අපේක්ෂකයාට අභිමත නාට්‍ය ගීතයක් තෝරාගෙන උචිත රූපණය ද සමඟින් ඉදිරිපත් කළ යුතු ය.<br><br>(ඒ සඳහා සංගීතය විශ්වවිද්‍යාලයේ සහය වාදකවරුන් විසින් සපයනු ලැබේ. නැතහොත් ඒ සඳහා අනුවාදනයක් Pendrive එකක ආ යුතු ය.)<br><br>මෙම ඇගයීමේ දී අපේක්ෂකයාගේ ගායන හැකියාව, ගායන සමඟින් රූපණ හැකියාව ශාරීරික රිද්මය පිළිබඳ කුසලතා ඇගයීමට ලක් කෙරේ. | 20% |
| මුළු ලකුණු | | **100%** |

## ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නිර්දේශිත ඒකල භාෂණ

නිර්දේශ කරනු ලබන කේවල භාෂිය / ආත්ම භාෂිය නාට්‍ය පිටපත් කොටස් හයෙන් එකක් (01) පමණක් තෝරාගෙන එය රූපණය සමගින් (කට පාඩමින්) ඉදිරිපත් කළ යුතු ය. පිරිමි අපේක්ෂකයන් පිරිමි චරිත සහ කාන්තා අපේක්ෂිකාවන් කාන්තා චරිත තෝරාගත යුතු ය.

**Hamlet by William Shakespeare**

හැම්ලට්

පරිවර්තනය - බන්දුල විතානගේ

චරිතය - හැම්ලට් (පිරිමි)

හැම්ලට්: ජීවත්වෙම්ද මියයම්ද, ඒකයි ප්‍රශ්නය. වඩා උදාරවන්නේ කුරිරු වාසනාවේ හී පහරින් සහ වෙඩි පහරින් දුක් විඳීමද? නැත්නම් කරදර සාගරයට විරුද්ධව අවිගෙන සටන් කිරීමෙන් ඒවා තුරන්කර ලීමද? මැරෙනවා යනු නිදාගැනීමයි. ඊට වඩා දෙයක් නෑ. නිදා ගැනීමෙන් අප කෙලවර කරන්නෙමු.

හද වේදනා සහ දහසක් චලන.

අප එය ආදරයෙන් ප්‍රාර්ථනය කරන්නෙමු.

මරණය යනු නිදා ගැනීමයි.

නිදා ගන්නවා යනු සමහර විට සිහින දැකීමයි. අන්න ඒක තමයි සහනය. මරණය නැමැති නින්දේදී අප දකින සිහින, අප මේ ජීවිතය ඉවතලූවාට පසුව අප මදක් නවතිමු. ඒකයි අප දුක් විඳීම එපමණක් දිග කලක් ඉවසන්නේ.

අප ජීවත්වන ලෝකයේ හිරිහැර කව්ද ඉවසන්නේ. පීඩකයාගේ අසාධාරණය,
උඩඟු මිනිසාගේ කෲර භාවය ප්‍රේමය නොතැකීම, නීතියේ ප්‍රමාදය, පාලකයින්ගේ හිංසා සහ අපහාස අහිංසකයෝ පෙලති.

ඔහුට සියල්ල කිරිච්චියකින් පමණක් විසඳාලිය හැකිව තිබියදී?

ගොරවමින් වෙහෙසවී හතිලමින් කව්රු කරදරයේ මෘගයෙක් වෙයිද?

මරණයෙන් පසුව යම්කිසි දෙයක බියක් නොවන්නට ගිය කෙනෙක් ආපසු නොඑනා,
කිසිවෙක් නුදුටු ලෝකය සිත අවුල් කරවයි......

එය අප පොළඹවයි දන්නා රට කරදර විඳදරා සිටීමට

නොදන්නා රටකට පියාඹා යනවාට වඩා? අන්න ඒ නිසයි

හෘද සාක්ෂිය අප නිවටයන් බවට පත් කරන්නේ.

**A Doll's House by Henrik Ibsen**

බෝනික්කි ගෙදර පරිවර්තනය - සුනිල්
විජේසිරිවර්ධන

චරිතය - නෝරා (කාන්තා)

නෝරා: ඕගොල්ලන්ගෙ ලස්සන ! කම්මුල් ජම්බු වගේ රතු වෙලා.

(නෝරා කතා කරගෙන යද්දී ළමුන් ද එකවර කතා කරති.)

ඕගොල්ලො සෙල්ලම් කළාද? හරි ෂෝක් ! ඔයා එමියි බොබ්වයි හිම කරත්තෙ තියාගෙන ඇද්දා? දෙන්නවම එකට? මගෙ අම්මෝ, හරිම හපන් වැඩක්නෙ. අයිවර් ඔයා හරිම හපනෙක්. නැනී ඔන්න ඔය පුංචි බෝනික්කිව මට පොඩ්ඩක් දෙන්න. (ඇය කුඩාම දරුවා ආයාගේ අතින් ගෙන වඩාගෙන වටේ කරකැවෙමින් නටයි.) ඔව්, ඔව්, බොබ් එක්කත් අම්මා මෙහෙම නටනවා. හැබෑට? ඕගොල්ලො හිම බෝලත් ගහ ගත්තා? අනේ මම එතන හිටියෙ නෑ නෙ. නෑ, නැනී ඔහොම ඉන්න අරින්න. මම ඒගොල්ලන්ගෙ ඇඳුම් ගලවන්නම්. මම ඒක ආසම වැඩක් නේ..... ඔයා හොඳටම හීතල වෙලා වගේ. අල්ලපු කාමරේ ස්ටෝව් එක උඩ අන්න උණු කෝපි ටිකක් ඔයාට තියලා ඇති.

(ආයා වම් පස කාමරයට යයි. නෝරා දරුවන්ගේ ඇඳුම් පැළඳුම් ගලවමින් සී සී කඩ විසි කරයි. ළමයින් හැමෝම එකවර කතා කරමින් සිටිති.)

නෝරා: හැබෑටම! ලොකු බල්ලෙක් ඔයා පස්සෙ එලෙව්වා. ඒත් එයා හැපුවේ නෑ නෙ. ඔව්, බල්ලො මේ වගේ පුංචි බෝනික්කි - බබාලව හපන්නෙ නෑ. අයිවර්, පාර්සල් දිහා බලන්න නම් බෑ. ඒවගෙ ඇතුළෙ තියෙන්නෙ මොනවද? හා, මං දන්නවා ඔයා ඒක දැනගන්න හොඳටෝම ආස විත්තිය. ඒයි, ඒයි අරින්නෙ නෑ, ඇඟට පනියි ඔන්න......, හරි, සෙල්ලම් කරන්න ඕන? මොනවද අපි එහෙනං කරන්නේ? හැංගිමුත්තං කරමුද? ආන්න හරි, අපි හැංගිමුත්තං කරමු. බොබ්, ඔයයි ඉස්සෙල්ල හැංගෙන්නෙ - මම? හා හොඳයි, මං හැංගෙන්නංකො ඉස්සෙල්ලම.

**Widows by Ariel Dorfman**

වැන්දඹුවෝ
පරිවර්තනය- සිරිල් සී. පෙරේරා
චරිතය - මැද කපිතාන් (පිරිමි)

(ගැහනුන් අමතන නියායෙන් කපිතාන් වේදිකාව සිට ප්‍රේක්ෂකයින් අමතයි)

මැද කපිතාන් : සහෝදරයිනි. අපේ නගරවල හා කඳු මිටියාවත්වල මෙතෙක් කල් පැවතුණු යුද්ධය අවසන් වී දැන් සාමය උදා වී තියෙනවා. දැන් ඉතින් අප විසින් කළ යුතුව තිබෙන්නේ අපේ රටට සමෘද්ධිය ළඟා කර දෙන නියම සාමය ගොඩනැඟීමේ ජාතික කර්තව්‍යයට උර දීමයි. නමුත් සමහරුන්ගේ සිත් තුළ තවමත් යුද්ධමය මානසිකත්වය පවතිනවා. මේ යුද්ධය නිසා අප සියලු දෙනාටත්, මේ රටටත් ජනතාවටත්, අපේ හමුදාවටත්, ආර්ථිකයටත්, විශාල හානියක් සිද්ධවුණා. ඒ නිසා දැඩි පියවරවල් ගැනීමට අවශ්‍යයි. සමෘද්ධිමත් අනාගතයක් ගොඩනැගිමේ අධිෂ්ඨානය සහ ධෛර්ය ඇති අය මේ ජාතික කර්තව්‍යයට උර දීමට සූදානමින් සිටිනවා. නුඹලා ද ඊට සහයෝගය දෙන්නේ නම් මෙතෙක් කල් නුඹලා අපට දැක් වූ එදිරිවාදිකම්, හා කළ විනය විරෝධී වැඩ අමතක කරන්න අපි සූදානම්. නුඹලා අතීතය අමතක කොට අප සමඟ එක් වන්නේ නම් අන්තිමේ දී සිදු වූ මේ තුවාල සුව වෙනවා නියතයි. නුඹලාගේ දිළිඳුකම, මන්දගාමී බව, නැති කිරීමට අවශ්‍ය ප්‍රජාතන්ත්‍ර වාදය හා තාක්ෂණය මේ රටට ගෙනෙනවා ඇති. පෝර නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ඉදි වෙනවා ඇති. සත්ව පාලනය දියුණු කරනවා ඇති. කෘමිනාශක නිෂ්පාදන කරනවා ඇති. පුස්තකාල විවෘතකරනවා ඇති. අලුත් ජනතාවක් වෙනුවෙන් අලුත් රටක් බිහි වෙනවා ඇති. නුඹලා අපට සහයෝගය දෙන්නේ නම් නුඹලා ගේ දුක, හා නුඹලා ගේ දිළිඳු කම නැති කරන්න අපට පුළුවනි.

**Widows by Ariel Dorfman**

වැන්දඹුවෝ

පරිවර්තනය- සිරිල් සී. පෙරේරා

චරිතය - සොපියා (කාන්තා)

සොපියාඃ උඹේ දූව මගේ තාත්තාගේ මළමිනිය ගෙනියන්න ඉඩ දුන්න එක වැරදියි. ඒ වරදට උඹල කිසිම කෙනෙකුට මං සමාව දෙන්නෙ නෑ. ඇලෙක්සැන්ඩ්‍රා, උඹේ නහරවල උඹේ අම්මාගේවත්, තාත්තාගේවත්, ලේ බිඳක් නැහැ. නමුත් පිඩෙලියා (පිඩෙලියා අමතමින්) මං හිතුවා උඹ එමලියානෝ ගේ දූව කියා. නමුත් උඹට වත්, උඹල කිසිම කෙනෙකුට වත් කිසිම දෙයක් තේරුම් ගන්න බැහැ. මේ ගෙය හැදුවේ මගේ තාත්තා, උඹලා ගේ සීයා. නමුත් උඹලා මගේ තාත්තා ගේ මළ මිනිය තනි කර දමා මාර්කැට්ටුවට ගියා. උඹලාට පණ තියෙන මිනිස්සුයි, මැරිච්ච මිනිස්සුයි විකුණා ගෙන කන්න පුළුවනි. තොපි තරම් වල් බැල්ලියො, වල් වේසියෝ මේ මුළු ගමේ ම නැහැ...............තොපි අර ගඟේ තියෙන ගල් වගෙයි. හිතක් පපුවක් නැහැ. අපි අපේ මැරිච්ච මිනිසුන් ගේ මළමිනි ගරු සරු ඇතිව අපේ සොහොන් බිමේ භූමදාන කරන තෙක් ඉර පායන්න දෙන්නෙ නැහැ. හඳ පායන්න දෙන්නෙත් නැහැ. හුළං හමන්න දෙන්නෙත් නැහැ. එතකොට තොපි තොපේ නැති වෙච්ච මිනිසුන් ගැන කල්පනා කරාවි. ඇලෙක්සැන්ඩ්‍රා කෝ තොගේ මිනිහා? මගේ පුතා, එමලියානෝ? යතිනා, කෝ මගේ පුතා අල්පොන්සු? අල්පොන්සු තොගේ මිනිහා නේද?

මොකක් ද තොගේ මිනිහට වුණේ? අතුරුදහන් වුණා නේද?........ කෝ අන්තෝනියෝ?..........කෝ තියෝ?......... කෝ ලුවිස්? කෝ රවුල්? පබ්ලෝ? හර්තාන්දෝ ක්ලෝඩියෝ? ජාකුවින්? එමලියානෝ ? එදිරෝදෝ? සවුල්? කෝ අන්දියස්? කාලෝස්? ලොරෙන්සෝ?........ කෝ මේ මිනිස්සු? මොකද උන්ට වුණේ? කෝ මිගෙල්? රොබෙටෝ ? මාරියෝ? සෙල්වදෝර්? එර්හැස්ටෝ.........

දිරිය මව හා ඇගේ දරුවෝ
හෙන්රි ජයසේන

චරිතය - දිරිය මව (කාන්තා)

දිරිය මවඃ අනේ චැප්ලේන් - පොඩ්ඩක් මොලේ පාවිච්චි කරමු. තමුසෙ හොඳ මිනිහ. ඔහෙගෙ කර පිට මගෙ ඔලගු බර පටවන්ඩ මම කැමති නෑ - මට ඕනෑ කරන්නෙ මමයි, මගෙ දරු පැටවුනුයි මේ කරත්තෙත් එක්කම මේ යුද්දෙන් එගොඩ කර ගන්ඩ........මගෙ හිතේ කිසිම අදහසක් නෑ අමුතුවෙන් පුද්ගලික ජීවිතයක් පටන්ගන්ඩ! මේ මොහොතෙ උනත් බොහොම අවදානම් වැඩක් මම කරන්නේ. සේනාපතියෙක් වැටිල - යුද්දෙ ඉවර වෙන කතා බහ හැම තැනම තියෙද්දී මේ බඩු තොගයකුත් අරගෙන. හොඳයි මම නට්ටං උනොත් ඔහෙට යන කල මොකද්ද? කොහෙ යන්ඩද? ජේනව නේද? ඔහෙට සාංකාවක්වත් නෑ - හැං ඔන්න ඔය දර ටික පළමු - හවස් සීතල ජාමෙ සීතල නැතුව ඉන්ඩ පුළුවනි එතකොට. ඒක කොච්චර ලොකු එකක් ද මේ වගෙ කාලෙක?

ඒ මොකක්ද?

(ඇය නැගී සිටියි බොහෝ සේ කැළඹී. හතිලමින්. කැත්රින් එයි. ඇගේ ඇසක් හා නළල ද වසා ලේ ගලන තුවාලයකි. නොයෙකුත් බඩු බාහිරාදිය ඈ පසුපස ඇදෙගෙන එයි නොයෙක් පාර්සල්, හම්බඩු, තම්මැට්ටමක් ආදිය)

මේ මොකද? උඹට තුවාල කළාද කවුරු හරි? මගදී? එන අතරමග දරුවට තුවාල කරළ! කිසිම සැකයක් නෑ, අර මෙතන ඉඳගෙන මගෙ බීම බිල වෙරිවුන සොල්දාදුව වෙන්ඩ ඕනෑ ! අපරාදෙ මම උඹට යන්ඩ ඇරියෙ - පැත්තකට දමාපං ඔය බඩු ටික - නරක තුවාලයක් නෙමෙයි - හම විතරයි තුවාලවෙලා තියෙන්නෙ - මම වෙලන්නම් තුවාලෙ - සුමානයක් යන කොට ඕක සනීප වෙලා. මූං මුරුගයන්ට හපන් !

(ඇය තුවාලය වෙලයි)

මෝදර මෝල - රන්ජිත් ධර්මකීර්ති

ලියන මහත්තයා : මම පිටිපස්ස පැත්තෙන් රාළහාමිගෙ කාමරේට ගොඩ වෙලා යන්නයි ආවෙ. ඒත් හාමිනේල ඉන්නව දකලයි ඉස්සරහින් ගොඩ වුනේ.

දැං ෆැක්ටේරියෙ බොහොම ජයට වැඩ කෙරෙනව හාමිනේ. බලන්න එපායැ මැෂින් හයි කරපු පහළ තට්ටු දෙකේ සිය ගානක් වැඩ කරනකොට තියෙන ලකේ ! ඊ වැඩ මුරේ යන වෙලාවට හරි ම අපූරුයි. ටියුබ් ලයිට් දාල....... ...... නිකං නිකං දිව්‍ය ලෝකෙ වාගෙ. අලුත් මැෂින්වල රතු ලයිට් පත්තු වෙනව, කොළ ලයිට් පත්තු වෙනව. අප්පේ හරිම අගෙයි. අනිත් එක හාමිනේ දැං වැඩත් ලේසිනෙ. මොකද ඉස්සර වගේ හදාපු බඩු අච්චුවෙන් අරගෙන යකඩ පොල්ලෙ දාල කරේ තියාගෙන යන්න ඕනෙයැ. වහලෙ හයි කරල තියෙන ආඬියා "රෑස්" ගාල හදාපු බඩුව අනිත් යන්තරේට ගෙනිහිං දානව.

අනෝමා : ඒක ඇත්ත. තාත්ත මෝල කරපු කාලේ වාගෙ නෙවේ. දැන් හැමදේම වෙනස් වෙලා. ඉස්සර මෝලේ වැඩ කළේ ටික දෙනයි. ඒ හැම කෙනාව ම අපි නමින් දන්නව; අඳුනනව. මෙහෙත් එනව යනව. ඒත් දැං කොහෙද? දැං ඔක්කොම අලුත් මූණු. ඉස්සර උදේට මෙතනින් බැලුවහම එක්කෙනා දෙන්න හෙමින් සීරුවෙ වැඩට යනව පේනව. ඒත් දැං එහෙම ද? උදේට සයිරන් එක වදින කොට මිනිස්සු රොත්ත පිටින් පොර කාගෙන ඇතුළට රිංගනව. සයිරන් එකට වැඩ පටන් ගන්නව. සයිරන් එකට කෑම කනව. සයිරන් එකට ආපහු වැඩ පටන් ගන්නව. සයිරන් එකට වැඩ නවත්තල ගෙදර යනව. මට නම් පේන්නෙ දැන් මිනිස්සුත් නිකං යන්ත්‍ර වෙලා වාගෙ. ඒ මිනිස්සුන්ගෙ මූණුවල හිනාවක් නෑ. සතුටක් නෑ.

තට්ටු ගෙවල් - සුගතපාල ද සිල්වා

සොමී : මම දන්නෙ නෑ. මට අනිත් ආත්මෙත් නිවනක් තියෙයිද කියල මට සැකයි. සැප විඳින්නත් සංසාර පුරුද්දක් තියෙන්න ඕන. මට හිතේ සතුටක් යන්තම්වත් තියෙන්නෙ ඔයා මෙහාට ආවාම විතරයි. එයා ගිය හැටියෙ මට ලොකු පාළුවක් දැනෙනව. මේ බිත්ති ළංවේගෙන ළංවේගෙන ඇවිත් මාව හිරකර ගනියි කියල මට බය හිතෙනව. පෙළක් වෙලාවට මම ඒක ආශාවෙන් බලං ඉන්නව. එහෙම ඉන්නකොට මගේ ඇස් නිලංකාර වෙනව. බිත්ති සේරම දිය උණා වගේ පේන්නෙ නැතිව යනව. එතකොට ඇගේ නූල් පොටක්වත් නැතිව සෙනඟ ගොඩක් මැද ඉන්නව වගේ මට හිරිකිතක් දැනෙනවා. සේරම මගේ දිහා බලල හිනාවෙනවයි කියල මට හිතෙනව.

මට මේව හිතේ තදකරං ඉන්න බැහැ. මට සතුටක් තියෙන්නෙ ඔයා ඉන්නකොට විතරයි. එතකොට මට අර පොතක කියවපු දෙයක් මතක් වෙනව. මම හරියට කකුල් දෙක යටින් මිනීවළ හෑරෙද්දි අහසෙ තරු ගණන් කරන ගෑනියෙක් වගෙයි.

ජයසේකර : ඉස්සර කාලෙ ලස්සන කුමාරිකාවක් හිටියලු. මහ නරක රාස්සයෙකුත් හිටිය.අර රාස්සය කුමාරිකාව සොරකම් කරගෙන ගියාලු. හොරකම් කරගෙන ගොහිං ගුහාවක හිරකරල තිබ්බලු. ටික කලකට පස්සෙ කවුදෝ කුමාරයෙක් අර කිමාරිව හොයාගෙන ගියාලු. රාස්සය ගෙදරට ආ වෙලාවෙ ඉඳල මොකක්දෝ වෙනසක් තියෙනවයි කියල රාස්සයට දැනුණ. මිනී කුණු ගඳක් දැනෙනව කියල රාස්සය කිව්වලු. මොකද උඹ කතා කරන්නෙ නැත්තෙ? උඹ දන්නෙ නැද්ද ඒ කතාව?

උඹල මොනවද දන්නෙ ? උඹල මොනවත් දන්නෙ නෑ.මටත් හැන්දෑවෙ ආ වෙලාවෙ ඉඳල ඒ වගේ මිනී කුණු ගඳක් දැනෙනව. උඹලට නැද්ද ගඳ එන්නෙ?

එහෙනම් උඹේ නහය හොඳ නෑ. මං ආ වෙලාවේ ඉඳල මට ඒ ගඳ දැනුණ. නැත්නම් මට දැනෙන්නෙ මගේ ගඳ ද? ඒත් උඹලට දැනෙන්නෙ නෑ ඒක නේද? මේ දවස්වල පත්තරේ තිබුණ හොඳ නිවුස් එකක්. කවුදෝ මිනිහෙක් ගෙදර නැති වෙලාවෙ තව මිනිහෙක් ගෙදරට ඇවිල්ල. ඒ මිනිහට අහුවෙලා මේ දෙන්නටම පිහියෙන් ඇනල මැරුවලු.

දුන්න දුනු ගමුවේ - සුගතපාල ද සිල්වා

දිළිඳුවතී : බැගෑ දැන් වැඩ අහවර වෙලා බස් එකේ කුඩු ගැහිල එනව ඇති.

මට නං හිතාගන්න බෑ එයා අතගාන මලපෙරේත පඩියෙන් කොහොම දෙකොන ගැටගහගන්නද කියල. දෙකොන විලක්කුව වගේ අපි දෙපැත්තෙන් ම දැවෙනව. මම අද බිත්ති පුරාම මකුණු හොටු සුද්දකළා. කොට්ට ටික අව්වට දැම්ම. අපේ සිපිරි යහන් ගබඩාව සුද්ද පවිත්‍ර කළා. ඉස්සර මං හිතං හිටිය ඒක අපේ සිරි යහන් ගබඩාව කියල.

අපි දැන් බබාල හදන්නෙ නෑ. හය්ය නෑ තව කටකට කන්න දෙන්න. දැන් බැගෑ තේ එක ඉල්ලගෙන ගෙදර ඒවි. ඉස්සර නං ආවම ඉල්ලන්නෙ හාදුවක්. දැන් ඉල්ලන්නෙ තේ එක.

මං ළමිස්සි කාලෙ බලාගෙන හිටිය සුදු අශ්වයා පිට නැගපු කුමාරයෙක් ඇවිත් මාව පැහැරගෙන යනකං.ඒත් මගෙ කුමාරය ආවෙ කුලී කාරෙහෙක. අතේ කඩුවක් තිඋනෙ නෑ. සාක්කුවෙ පෑනක් තිබුන. පෑන කඩුවට වඩා බලගතුයි කියන හන්ද මං හිතුව මගේ හොඳ කාලෙ ලැබුවයි කියල. ඒත් පස්සෙ බැලින්නං ඒක බෝල්පොයින්ට් පෑනක්.

ධනසේන : හොඳයි - තව එකක්. අපි ටිකක් බෙල්ල දික්කරල බලමු ලෝකෙ දිහාවැඩියෙන් සල්ලි . තියෙන්නෙ කා ළඟ ද? කාසිබාගෙ තියෙන්නේ කා අතේ ද? අඩුවෙන් වැඩ කරන මිනිස්සු ළඟ. නැත්නම් වැඩ නොකරන ජනතාව අතේ ඉතින් මේ යක්කුන්ට සල්ලි වැඩි .උනොත් මොකද වෙන්නේ? තේරෙන්නේ නැද්ද උනුත් වැඩ නොකර අරිවිඋනුත් අපේ ගොඩට . එතකොට .වැටෙනවාකොහෙන් ද අපි කම්කරුවෝ හොයන්නෙ? දැන් වැඩි පඩි ඉල්ලලා අවසාන අවිය අතට ගන්න යනවලුමං හිතන්නේ උන්ගේ අවසා .නෙ! මේ අවිය දැන් හොඳට ම මොට්ට වෙලා කියල මේ මොට්ටයින්ට තේරෙන්නේ නැහැ. අපිට තියෙන්නේ අහක බලාගෙන ඉන්න. නොදැක්කා වගේ. නවත්තන්න යන එක මෝඩකමක්. මම මේ අධ්‍යක්ෂ මණ්ඩලයට ස්තුති කරනවා මේ ප්‍රශ්නය මට බාරදුන් එක ගැන. තමුන්නාන්සේලා වෙනුවෙන් මම ඒක බලාගන්නන්. තමුන්නාන්සේලා, ඔය කොනේ කාමරේ ඇති බාර් එක, එතෙන්ට යන්න, ගොහින් පොඩ්ඩක් විනෝද වෙන්න - මේ අවුරුද්දේ ලාබවලින් මොකද කරන්නෙ කියලා හිතන්න.බ්ලඩ් ෆූල්.....

**Trumpets and Raspberries by Dairo FO**

ඩැරියෝ ෆෝ

පරිවර්තනය - ප්‍රසන්න විතානගේ

රෝසා : ප්‍රොෆෙසර්, එයා මගෙ දිහා බලනවා. අර බලන්න එයා ඉදිමිච්ච ඇස් කොනෙන් මගෙ දිහා බලනවා. එයා මාව දැක්කා. අන්න අඳුනගත්තා. මට හොඳට ම විශ්වාසයි. අන්තෝනියෝ... අන්තෝනියෝ... මේ මම ඔයාගෙ රෝසා. ඔයාට වෙච්ච දේ ආරංචි වුණු හැටියේ මට සේරම අමතක වුණා. ඇත්තම කියනව නම් අන්තෝනියෝ මේ වෙච්ච දේ ගැන මට සන්තෝෂයි. නෑ නෑ මට ඒක නෙවෙයි කියන්න ඕන කළේ. ඔයාගෙ රෝසාට එයාට සාත්තු කරන්න පුළුවන් වුණු එක ගැන සන්තෝෂයි කියලා.ඔයා එයත් එක්ක දිව්වට කමක් නැහැ. අපි අතීතය වලලලා දාමු. නෑ නෑ අන්තෝනියෝ ඔයාට වැරදි විදියටයි ඇහුණේ. මම කිව්වේ අපි ඔයාව වල දානවා කියලා නෙමෙයි. අයියෝ මම මොන තරම් මෝඩියක්ද? කෝ මෙතන තිබුණ එයාගෙ උගුරු දණ්ඩ? ඒක නැහැ. ඒ වෙනුවට එතන තියෙන්නේ වලක්.

අන්තෝනියෝ : හරි හරි හරි මම ඇයි මේ අමාරුවෙ වැටුණේ? මම මගේ ෆැක්ටරියේ වැඩ කරන කෙල්ලෙක් එක්ක ඇල ඉවුරක පාඩුවෙ හිටියා.එක පාරටම කාර් එකක් තවත් කාර් එකක් ඉස්සර කරගෙන විදුලියක් වගේ ආවා. මම කිව්වා බලන්න මේ මහ රෑ පාරේ රේස් යන්න හදන පිස්සෝ, මුං නම් කෙලවර වෙන්නේ ස්කීඩ් කරල තමයි කියල.මට ඒක කියල ඉවර කරන්න හම්බ වුණේ නැහැ. ඒ කාර් එක ස්කීඩ් කරලා මහ සද්දයකින් ඈතට විසි වුණා. ඒ කාර් එක වන් ටු ත්‍රී එකක්. අපේ ෆැක්ටරියේ ඒව හදන නිසා මම ඒක දන්නවා. ඒ එක්කම ආපු අනෙක් කාර් එක මේ කාර එක උඩින් ගිහින් ඇලට වැටුණා.

ඉතිං මම මොකද කරන්න ඕනෑ? මම මගේ කාර් එකෙන් එළියට පැනලා බැලුවා කාවවත් බේරගන්න පුළුවන්ද කියලා. දොරවල් පොඩි වෙලයි තිබුණේ. මම පයින් ගහල එකක් ඇර ගත්තා. ඇතුළෙන් ආපු දුමෙන් මගේ ඇස් වැහිල කඳුළු ගලන්න පටන් ගත්තා. මට ඒ එක්කම කැස්සක් ආවා. ඒ වුණාට මම ඇතුලෙ හිටිය එක එකා එළියට ඇදගෙන ආවා. එක්කෙනයි, දෙන්නයි, තුන් දෙනයි, ඒ කාටවත් සිහිය තිබුණෙ නැහැ. මම හතරවැනි එක්කෙනත් එළියට ගන්න හැදුවා. ඔයා දකින්න තිබුණෙ මිනිහව. මිනිහ සම්පූර්ණයෙන් ම වප්ප වෙලා. මිනිහ හිටියෙ ඩ්‍රයිවින් සීට් එක ළඟ. මිනිහගෙ මුහුණ වින්ඩ්ස්ක්‍රීන් එකේ වැදිලා සමතලා වෙලා. හරියට කාසියක් වගේ. රාජ්‍ය ලාංඡනය විතරයි අඩු.

2006.05.06